විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 04/2020

මගේ අංකය:විවැ/චක්‍රලේඛ/2020
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත, කොළඹ 10.
2020.04.02

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**කොරෝනා වෛරස් තත්ත්වය හේතුවෙන් නියමිත දිනට විශ්‍රාම ගැන්වීමට නොහැකි වූ හා විශ්‍රාම ගන්වා ඇති නමුදු මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ අයදුම්පත යොමුකිරීමට නොහැකි වූ එහෙත් විශ්‍රාම වැටුප සඳහා හිමිකම ලබන රජයේ නිලධරයන්ට/විශ්‍රාමිකයන්ට සහන සැලසීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ අංක 08/2020 හා 2020.03.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා බැඳේ.

02. එහි 4 වන ඡේදය අනුව පහත සඳහන් විශ්‍රාමිකයන් වෙත රුපියල් 25,000 ක දීමනාවක් හිඟ ගෙවීමකින් තොරව අප්‍රේල් හා මැයි මාස සඳහා පමණක් ගෙවනු ඇත. මෙසේ ගෙවනු ලබන මුදල් විශ්‍රාම වැටුප් ගණනය කර ගෙවීමේදී විශ්‍රාම පාරිතෝෂික මුදලින් හෝ හිඟ විශ්‍රාම වැටුපෙන් එකවර අය කරගනු ලැබේ.

I. 2020 පෙබරවාරි මස 01 දින සිට (එදිනද ඇතුළත්ව) මෙම චක්‍රලේඛය නිකුත් කළ දිනය තෙක් විශ්‍රාම වැටුප් අයදුම්පත සඳහා මාර්ගගත පද්ධතියට තොරතුරු ඇතුළත් කරන ලද හා එහෙත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අදාල ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ විශ්‍රාමිකයින්
II. 2020 පෙබරවාරි මස 01 දින සිට (එදිනද ඇතුළත්ව) මෙම චක්‍රලේඛය නිකුත් කළ දිනය තෙක් විශ්‍රාම වැටුප් අයදුම්පත මාර්ගගත පද්ධතියෙන් යොමු කර අඩුපාඩු පැවතීම හේතුවෙන් නැවත ආයතනය වෙත හරවා යවන ලද විශ්‍රාමික අයදුම්පත්
III. 2020 පෙබරවාරි මස 01 දින සිට (එදිනද ඇතුළත්ව) මෙම චක්‍රලේඛය නිකුත් කළ දිනය තෙක් විශ්‍රාම වැටුප් අයදුම්පත යොමුකර සම්මුඛ පරීක්ෂණයට ද කැඳවා එහිදී ඉදිරිපත් කරන ලද ලේඛන වල අඩු පාඩු පැවතීම හේතුවෙන් විශ්‍රාම වැටුප සක්‍රිය නොකරන ලද විශ්‍රාමිකයින්

03. ඒ අනුව ඉහත කාණ්ඩ වලට අයත් විශ්‍රාමිකයින් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන පරිදි වන දීමනාව අප්‍රේල් මස සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

04. ඉහත කාණ්ඩ වලට අයත් විශ්‍රාමිකයින් සඳහා ඔබ ආයතන මඟින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 8/2020 හි සඳහන් පරිදි වන දීමනාව ගෙවීමෙන් වළකින ලෙසද කාරුණිකව දන්වමි. මේ පිළිබඳව ඔබ යටතේ ඇති සියලු ආයතන දැනුවත් කිරීමට පියවර ගන්නා මෙන්ද වැඩිදුරටත් දන්වමි.

ඒ. ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

01. ලේකම්, රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.පි.
02. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කරු.දැ.ගැ.පි.
03. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.පි.
04. විගණකාධිපති - කරු.දැ.ගැ.පි.